# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1980/33 – 2016 අගෝස්තු 18 වැනි බ්‍රහස්පතින්දා – 2016.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්පෙ පත්තුව දකුණ සුළු කොට්ඨාසයේ, ගොවියාපාන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක GA/HBR/2016/137 සහ 2016.04.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඔරුතොටවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0007**
උතුරට: ආර්. ඩී. සුසන්ත, එච්. ඩබ්. එම්. ඒ. ගුණසේකර සහ එච්. යූ. පී. ප්‍රියන්ත හිමිකම් කියන ඔරුතොටවත්ත සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී, මුපි ගා 4135 හි කැබලි අංක 4 සහ 5; දකුණට: මුපි ගා 4135 හි කැබලි අංක 5; බටහිරට: ආර්. ඩී. සුසන්ත සහ එච්. ඩබ්. එම්. ඒ. ගුණසේකර හිමිකම් කියන ඔරුතොටවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ඔරුතොටවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0046**
උතුරට: එච්. යූ. පී. ප්‍රියන්ත හිමිකම් කියන ඔරුතොටවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර සී, මුපි ගා 4135 හි කැබලි අංක 1 සහ 4; දකුණට: මුපි ගා 4135 හි කැබලි අංක 4 සහ 5; බටහිරට: කැබලි අක්ෂර ඒ, එච්. ඩබ්. එම්. ඒ. ගුණසේකර සහ එච්. යූ. පී. ප්‍රියන්ත හිමිකම් කියන ඔරුතොටවත්ත.

03. **කැබලි අක්ෂර 'සී' – ඔරුතොටවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0003**
උතුරට: පී. කේ. ඒ. පී. ප්‍රනාන්දු හිමිකම් කියන ඔරුතොටවත්ත; නැගෙනහිරට සහ දකුණට: මුපි ගා 4135 හි කැබලි අංක 1; බටහිරට: කැබලි අක්ෂර බී, එච්. යූ. පී. ප්‍රියන්ත සහ පී. කේ. ඒ. පී. ප්‍රනාන්දු හිමිකම් කියන ඔරුතොටවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2015/එච්ඩබ්ලිව්/309.
2016 අගෝස්තු මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැඳුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 127

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

අංක 1975/43 හා 2016 ජූලි 13 වැනි දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* පළකර ඇති 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයේ කැබලි අක්ෂර 'ඒ' සහ කැබලි අක්ෂර 'බී' වලට අදළ ඉඩමේ නම ලෙස කිරිවානගහවත්ත යනුවෙන් සඳහන් වී ඇතත්, එය කිරිවානගගවත්ත යනුවෙන් සංශෝධනය විය යුතු ය.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

මගේ අංකය: කේඕඊ/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/01/49.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2003/වීආර්පී/484.
2016 අගෝස්තු මස 15 වැනි දින,

09 – 128


1A – G24048 – 24 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*